මාධ්‍ය මාර්ගෝපදේශයන් ඔස්සේ දැක්වෙන ආකාරයට, යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගමිකත්වය පුවතකට ඇතුළත් විය යුත්තේ, එය එම පුවතට සෘජුවම අදාළ වේ නම් පමණි.

මල්වානේ හිස් ඉඩමක එළ ගවයෙකු මස් කරමින් සිටි පුද්ගලයන් තිදෙනෙකු පොලිස් අත්අඩංගුවට පත්වීමේ සිදුවීමක් දිනමිණ පුවත් වාර්තාවකින් (අගෝස්තු 21, 2023) ආවරණය වී තිබූ ආකරය ඉහත දැක්වුණු මාධ්‍ය ආචාර මාර්ගෝපදේශය පසුබිම් කරගනිමින් විමසා බැලිය හැක.

සිරස්තලය: "මල්වානේ හිස් ඉඩමක එළ ගවයකු මස් කරමින් සිටි 3ක් අල්ලයි" (අන්තර්ගතය තුළ, මෙම සැකකරුවන් "මුස්ලිම් ජාතිකයෝ" වන බව දැක්වේ.)

ඔබ සිතන ලෙසට,

1) මෙම අත්අඩංගුවට ගැනුණු සැකකරුවන්ගේ වාර්ගිකත්වය "මුස්ලිම්" වීම පුවතට අදාළ වන්නේ කෙසේ ද? එම වාර්ගිකත්වය නොමැතිව මෙම පුවත වාර්තා කළෑ නොහැකිද?

2) මෙසේ සෘණාත්මක පසුබිමක එක් වාර්ගිකත්වයක් පමණක් ඉස්මතු කොට දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයට අයත් පුද්ගලයින් සම්බන්ධයෙන් පොදුවේ අයහපත් අදහසක් සමාජගත වීම සහ එම වාර්ගිකත්වය ඒකාකෘතික වීම (stereotyping) සිදු නොවන්නේ ද?

මූලාශ්‍ර:
https://accountablejournalism.org/.../nuj-race-reporting...
https://www.article19.org/.../3093/7d0676b-793d318.pdf
https://policeaccountability.org.au/.../reporting-crime.../